# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2021 (2022)

උක්ත විභාගය 2022 මැයි මස 23 දින ආරම්භ කර ජුනි මස 01 දින දක්වා පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පාසල් අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර හා කාලසටහන් අදාළ විදුහල්පතිවරුන් වෙත ද පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රවේශ පත්‍ර ඔවුන් තම අයදුම්පතේ සඳහන් කර ඇති ලිපිනයට ද තැපැල් මගින් යවා ඇත.

2022 මැයි මස 17 දින වන විට ප්‍රවේශ පත්‍ර නොලැබුණු විදුහල්පතිවරුන් තම පාසලේ අංකය, පාසලේ නම, ලිපිනය සහ අදාළ තොරතුරු ද ඇතුළත් ලිපියකින් හෝ ෆැක්ස් මගින් ඒ බව මා වෙත දැනුම් දිය යුතුය. පෞද්ගලික අයදුම්කරුවෙකු නම්, අයදුම්පත් භාරගත් අවසාන දිනයට හෝ එම දිනයට පෙර තමා මාර්ගගතව අයදුම්පත් ඉදිරිපත් කර ඇත්නම්, එම අයදුම්පතේ පිටපතක් අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය සහ විභාග ගාස්තු ගෙවා ලබාගත් රිසිට් පතේ ඡායා පිටපතක් හෝ විභාග ගාස්තු ගෙවූ බවට තැපැල් ස්ථානාධිපතිගෙන් ලබාගත් සහතික කරන ලද ලිපියක්ද සමග පහත සඳහන් තැපැල් ලිපිනයට එවීමෙන් හෝ පැමිණ හෝ වහාම සිය ප්‍රවේශ පත්‍රය ලබාගත යුතු ය. විදුහල්පතිවරුන් හා පෞද්ගලික අයදුම්කරුවන් මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

විදුහල්පතිවරුන් හා පෞද්ගලික අයදුම්කරුවන් වෙත ලැබී ඇති ප්‍රවේශ පත්‍රයන්හි විෂය සංශෝධන, මාධ්‍ය සංශෝධන හා නාම සංශෝධන සිදුකර ගැනීමට ඇත්නම්,

- ➢ මෙවර සියලු ම සංශෝධන මාර්ගගතව සිදුකර ගත යුතු අතර, ඒ සඳහා http://onlineexams.gov.lk/eic වෙබ් අඩවිය වෙත පිවිසිය යුතු ය.
- ➢ එක් අයදුම්කරුවෙකුට මෙම සංශෝධන සිදු කර ගැනීමට ලැබෙනුයේ එක් අවස්ථාවක් පමණි.
- ➢ විධිමත් පරීක්ෂණයකින් තහවුරු කරගත් නාම සංශෝධන පමණක් දත්ත පද්ධතියෙහි යාවත්කාලීන කරනු ලබන අතර, තහවුරු නොවන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ➢ මෙම විභාගයේ විභාග මධ්‍යස්ථාන මාරු කිරීම් සිදු කරනු නොලැබේ.

**අයදුම්කරුවකු වෙනුවෙන් වෙනත් අයෙකු විභාගයට පෙනී සිටීම, පොත් පත්, සටහන් හෝ ඉලෙක්ට්‍රොනික උපකරණ (උදා : ජංගම දුරකථන, සුහුරු අත් ඔරලෝසු (Smart Watches)........... ආදිය) විභාග ශාලාවට රැගෙන ඒම හා භාවිතය, වෙනත් අයදුම්කරුවකුගේ උදව් ලබා ගැනීම හෝ උදව් දීම සහ විභාග ශාලාවේ හා ඒ අවට නොමනා හැසිරීම විභාග පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි. මෙම විභාගය සඳහා ගණක යන්ත්‍ර හා මකන දියර භාවිත කිරීමට ඉඩදෙනු නොලැබේ.**

**විමසීම් :-** දුරකථන අංක : 011 - 2784208, 2784537

ෆැක්ස් අංකය : 011 - 2784422

තැපැල් ලිපිනය : විභාග කොමසාරිස් ජනරාල්, පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව, තැ.පෙ. 1503, කොළඹ.

**විභාග කාල සීමාව තුළ පැය 24 පුරාම ක්‍රියාත්මක මෙහෙයුම් මැදිරිය**

දුරකථන අංක : 011 - 2785211, 011 - 2785212, 011 - 2784208, 011 - 2784537

**ක්ෂණික ඇමතුම් අංකය** : 1911

**එල්.එම්.ඩී. ධර්මසේන**
**විභාග කොමසාරිස් ජනරාල්.**

**6/4/සා.පෙළ/2021**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාව,**
**පැලවත්ත, බත්තරමුල්ල.**
**2022.05.06 දින.**